# පුරාවිද්‍යාත්මක උරුමය සහ මානවයා (ජාතික කෞතුකාගාර පුරාවස්තු මංකොල්ලය ඇසුරින්)

එච්. එම්. චතුරිකා කුමාරි හේරත්*

1998 අංක 24 දරණ පුරාවස්තු(සංශෝධන) පනතට අනුව," පුරාවිද්‍යාත්මක උරුමය යන්නෙන්, මනුෂ්‍ය වර්ගයාගේ භෞතික උරුමයේ යම් කොටසක් පිළිබඳව ප්‍රාථමික තොරතුරු පුරාවිද්‍යාත්මක ක්‍රමවලින් සැපයෙන්නේ ද ඒ කොටස අදහස් වන අතර ඊට මානව පැවැත්මේ සියලු ශේෂ ලාංඡන සහ මානව ක්‍රියාකාරීත්වයේ සියලු ලක්ෂණවලට අදාළ ස්ථාන අතහැර දමන ලද ව්‍යුහය ද සියලු වර්ගවල නෂ්ටාවශේෂ සහ ඒවා ආශ්‍රිත සොයාගත හැකි ද්‍රව්‍ය ද ඇතුළත් වේ" යනුවෙන් අදහස් කරයි. මෙම උරුමය ක්ෂේත්‍රයක් හෝ වස්තුවක් ආදී වූ ඕනෑම ස්වභාවයකින් හමුවිය හැකිය. වර්තමානය වන විට මෙම උරුමය විවිධ වූ සාධක මගින් විනාශ වීමට ලක්වේ. ප්‍රධාන වශයෙන් ස්වභාවික හේතු සහ මානව බලපෑම මත එය සිදුවේ. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ පුරාවස්තු විනාශ වීම සඳහා බලපානු ලබන මානවයා විසින් සිතාමතා සිදුකරනු ලබන ක්‍රියාවන් පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමයි. එහිදී මූල බීජය ලෙස තෝරාගනු ලැබුවේ 2012-03-16 දින සිදුවූ පුරාවස්තු මංකොල්ලයට සම්බන්ධ සිදුවීම් පෙළයි. මෙම අධ්‍යයනය සඳහා පාදක කරගන්නා ලද මූලාශ්‍ර වන්නේ පුවත්පත් සහ සගරා ආදියේ පළවූ ලිපි, එම සිදුවීමට සම්බන්ධව විවිධ මාධ්‍යය මගින් ප්‍රචාරය කරන ලද පුවත්හි දර්ශන පට ආදිය යි. අන්තර්ජාලය ද මේ සඳහා භාවිත කළේය. ඊට අමතරව මෙම අධ්‍යයනය සඳහා 1940 අංක 09 දරණ පුරාවස්තු ආඥා පනත, 1998 අංක24 දරණ පුරාවස්තු (සංශෝධන) පනත, 1998 සංස්කෘතික දේපල පනත, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ජාතික පුරාවිද්‍යා ප්‍රඥප්තිය-2006, මාධ්‍ය අචාර ධර්ම සංග්‍රහය ආදිවූ අණපනත් ආශ්‍රේය කරගත්තේය.

මෙම අධ්‍යයනයේ සොයාගත් කරුණු මත පදනම්ව සාකච්ඡා කරන විට පැහැදිලිවන කරුණක් වන්නේ පුරාවස්තු විනාශයේ ප්‍රධාන කාරකයා බවට මානවයා පත්වී හමාර බවය. එයිනුදු, නොසිතා සිදු කරනු ලබන ක්‍රියාවලීන්ටත් වඩා සිතාමතා සිදුකරනු ලබන ක්‍රියාවලීන් ප්‍රධාන ස්ථානයක් ගන්නා බව පෙනීයයි. ජාතික කෞතුකාගාර පුරාවස්තු මංකොල්ලයේදී රටට වැදගත් වටිනා පුරාවස්තු රැසක් අහිමිවීමට තිබුණි. කෞතුකාගාර සේවකයන්ගේ නොසැලකිලිමත් භාවය, මෙන්ම තම රට පිළිබඳව හැඟීමක් නොමැතිවීම හේතුවෙන් සෙසු රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය විනාශවීමේ සීඝ්‍රතාවය ඉහළ මට්ටමක පවතින බව හඳුනාගත හැකිය. එමෙන් ම මෙයට සම්බන්ධ සියලු වරදකරුවන්ට නිසි දඬුවම් ලබාදුන්නා ද යන්න මෙන්ම මෙයට සම්බන්ධ මුල් පුරුක් නීතියේ රැහැනට හසුකර ගත්තාද යන්න ගැටලු සහගතය. විවිධ මාධ්‍ය ආයතන මගින් මෙම තොරතුරු ප්‍රචාරය කිරීමේදී විකෘති තොරතුරු ඉදිරිපත් කර තිබුණි. ධනය බලය උපයෝගී කරගනිමින් අතීත උරුමය විනාශ කිරීමට තරම් මානවයා දරුණු වී ඇත. මේ ආදී කරුණු මගින් මානවයා විසින් සිතාමතා පුරාවස්තූන් විනාශ කිරීමට පෙළඹී ඇති බව මෙන්ම මානවයා පුරාවස්තු විනාශයේ ප්‍රධාන කාරකයා වී ඇති බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පදඃ පුරාවස්තු, විනාශය, මානවයා, අණ පනත්, ජාතික කෞතුකාගාරය.

* පුරාවිද්‍යා අධ්‍යන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. cherath712@gmail.com